**ජාතික විද්‍යා පදනම - 2023**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික විද්‍යා පදනමේ (''පදනම'') 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයට ගන්නා පිරිවැය වටිනාකම රු.100,250,215 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 92 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව තවමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.100,250,215 ක වූ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නැවත සමාලෝචනය කිරීම් සඳහා වත්කම් හඳුනා ගැනීමට කටයුතු කරමින් සිටින අතර ඒ සම්බන්ධව විගණන කළමනාකරණ කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අපේක්ෂා කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| Office 365 A3 මෘදුකාංගයේ 2022 නොවැම්බර් 5 දින සිට 2023 නොවැම්බර් 04 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා බලපත්‍රය අලුත් කිරීම වෙනුවෙන් ගෙවන ලද රු.464,356 ක් 2023 හා 2024 වර්ෂ වෙනුවෙන් දරන ලද වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.392,038 ක් අඩුවෙන් හා කලින් ගෙවූ වියදම රු.392,038 ක් වැඩියෙන් දැක්විණි. | Office 365 A 3 මෘදුකාංග බලපත්‍රයට අදාල ලේඛන ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීමේ දී බලපත්‍රයේ දින වකවානු නිසිපරිදි සඳහන් කරන ලද ලේඛනයක් ඉදිරිපත් කර නොතිබීම නිසා එම වියදම 2024 වියදම් ලෙස ගිණුම්වල සටහන් කරන ලදී. කෙසේ වුවද මෙම වියදම 2023 නොවැම්බර් 05 සිට වන වියදමක් බව තහවුරු වී ඇති බැවින් අදාළ නිවැරදි කිරීම් 2024 වසරේ දී සිදු කරනු ලැබේ. | වර්ෂයට අදාල සියලු වියදම් වාර්ෂිකව ගිණුම්වලට ඇතුලත් කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණයහිමි ශේෂය තුළ ඇතුලත් වසර 5 කට වැඩි රු.2,045,055 ක් හා වසර 2 ට වැඩි රු.906,895 ක් ලෙස එකතුව රු.2,951,950 ක් වූ ණයහිමි ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කුරුළු ව්‍යාපෘතියෙහි එක් ව්‍යාපෘතියක අවසන් වාර්තාව ලබා ගත් වහාම පියවන අතර කොවිඩ් 19 හා Kids naturalist ව්‍යාපෘති වෙනුවෙන් පරිත්‍යාගශීලීන් ගෙන් ලද මුදල්වලින් ඉතිරි මුදල් සම්බන්ධයෙන් ඔවුන්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2022 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් වෙන්දේසි කළයුතු බවට හා දන්වා ඇති පරිදි ක්‍රියාමාර්ග ගත යුතු බවට නිර්දේශ කරන ලද භාවිතයට ගත නොහැකි වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබා දිම ප්‍රමාද විම නිසා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාවිතයට ගත නොහැකි ලෙස හදුනාගත් භාණ්ඩ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 438 අනුව සුදුසු පියවර ගැනිමට නොහැකි විය. එම භාණ්ඩ ඉතා ඉක්මනින් අපහරණය කිරිමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුයි. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ හි 9.1 ඡේදයෙහි (අ) හා (ආ) | මාණ්ඩලික නිලධාරියෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ නිලධාරියෙකුට රු. 25,000 ක උපරිමයක් දක්වා සුළු මුදල් අග්‍රිමයක් තබා ගැනීම සඳහා සිය අභිමතය මත අවසර දීමට ගණන් දීමේ නිලධාරියෙකුට හැකිය යන්නට පටහැනිව පදනම විසින් කළමණාකරන සහකාර සේවයේ නිලධාරීන් තිදෙනෙකුට අවස්ථා 27 කදී එකතුව රු.1,577,900 ක් අග්‍රිම | මෙම මුදල් අත්තිකාරම් ඉන්ධන ලබා ගැනීම සඳහා ලබා ගෙන ඇත. ජාතික විද්‍යා පදනම දිර්ඝ කාලයක සිට ඉන්ධන ලබා ගන්නේ ණය පදනම මත වන අතර රට තුල ඇති වූ ඉන්ධන අර්බුදයත් සමගම ඉන්ධන මිල ඉහල යාම හේතුවෙන් 2022 වසරේ අගොස්තු මස සිට එම ආයතනය ණය පදනම මත ඉන්ධන නිකුත් කිරිම තාවකාලිකව නතර කල අතර, එතැන් සිට 2023 ජුලි මස දක්වා එම තීරණය ක්‍රියාත්මක විය. එම කාලය තුල ආයතනයේ සංචිත වාහන වලට ඉන්ධන සැපයිම සඳහා මුදල් අත්තිකාරම් ලබා ගැනීමට සිදු විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ලබා දී තිබුණි. | | |
| උ) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේද යේ 1 වගන්තිය | රජයේ නිලධාරියෙකුට නවාතැන් සහ යැපීම් වෙනුවෙන් දරණ ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා සංයුක්ත දීමනාව ද ගමන් වියදම් ද ප්‍රතිපූර්ණ කරනු ලබන නමුත් ඊට පටහැනිව මහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව පදනම විසින් 2019 ඔක්තෝබර් මස කළමණාකරණ මණ්ඩල තීරණ ප්‍රකාරව ප්‍රදර්ශන හෝ ආයතන පරිශ්‍රයෙන් පිටත පවත්වනු ලබන වැඩසටහන් සඳහා සහභාගී වන නිළධාරීන් 5 දෙනෙකු සඳහා දින 18 ක් වෙනුවෙන් දුෂ්කර දීමනා (Hardship Allowance) එකතුව රු.11,200 ක් හා ආහාරපාන සඳහා එකතුව රු.68,000 ක් ගෙවා තිබුණි. | ප්‍රදර්ශනවල රාජකාරි ඉටු කිරිම ඉතා අපහසු කාර්යයක් වන බැවින් ඒ වෙනුවෙන් සහභාගි විමට කාර්ය මණ්ඩලය දිරිමත් කිරිම සඳහා ප්‍රදර්ශනයන් සඳහා සහභාගි වන්නන් වෙනුවෙන් දුෂ්කර දිමනාවක් ගෙවිමට කලමණාකරන මණ්ඩලය විසින් 2019 වර්ෂයේදි තිරණයක් ගෙන ඇති අතර, එම තිරණය අනුව, පෙර සඳහන් කල මහපොල ප්‍රදර්ශණය සඳහා සහභාගි වූ නිළධාරින් සදහා දුෂ්කර දිමනාව ගෙවා ඇත. මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවනු ලබන සියලුම දිමනා අනුමැතිය සඳහා මහා භාණ්ඩාගාරයට දැනටම ඉදිරිපත් කර ඇත. ඒ සදහා අනුමැතිය ලැබිමත් සමග ඉදිරි ගෙවීම් සිදු කරනු ඇත. එතෙක් ආයතන සංග්‍රහය අනුව ගෙවීම් කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,842,305 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.38,548,294 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,705,989 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් රු.18,467,208 කින් අඩු වී තිබීම හා අනෙකුත් වියදම් රු.1,185,223 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පාසල් හා විශ්ව විද්‍යාල මගින් සිදු කරනු ලබන විද්‍යා අධ්‍යාපන හා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ප්‍රදාන ලබා දීමේ වැඩසටහනක් සැලසුම් කර තිබූ අතර ඒ පිළිබඳව විශ්ව විද්‍යාල හා පාසැල් දැනුවත් වී | විගණන නිරීක්ෂණය සමග එකග නොවේ. ජාතික විද්‍යා පදනමේ විශේෂ විද්‍යා අධ්‍යාපන ව්‍යාපෘතිය මඟින් සිදු කරනුයේ සිසුන්ගේ විද්‍යා සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමට මහ සැලසීමයි | රටතුල විද්‍යා අධ්‍යාපනය ඉහල නැංවීම හා ප්‍රචලිත කිරීමේ අරමුණින් පදනම විසින් ප්‍රමාණවත් පරිදි |

| | | |
|---|---|---|
| නොතිබීම හේතුවෙන් මෙම වැඩසටහන යටතේ ප්‍රදාන ලබා ගැනීම සඳහා පාසැල් 05 ක් පමණක් ඉල්ලුම් කර ඇති අතර රු. 690,153 ක ප්‍රදාන ලබා දී තිබුණි. | | පාසල් දැනුවත් කිරීම කල යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ සිට දේශගුණික විපර්යාස හා ජාතික ආපදා යන තේමාව යටතේ සිදු කළ පර්යේෂණ ව්‍යාපෘති 2කට අදාලව එකතුව රු. 8,454,100 ක් ප්‍රදානය කර තිබුණු අතර එක් ව්‍යාපෘතියක තේමාව හා නියැදිය වෙනස් කිරීමටත්, අනෙක් ව්‍යාපෘතියේ නියැදිය සීමා කිරීමටත් ගත් තීරණය හේතුවෙන් එළඹි නිගමනවල ප්‍රමාණාත්මක භාවය දරන ලද වියදමට සාපේක්ෂව ප්‍රමාණාත්මකද යන්න විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | විගණන නිරීක්ෂණය සමග එකග නොවේ. වඩාත්ම බලපෑමක් ඇති ප්‍රදේශය අධ්‍යනය සඳහා යොදා ගැනීම තීරණාත්මක විශ්ලේෂණ සඳහා වඩාත් ඵලදායී වේ. දිවයිනේ සෙසු ප්‍රදේශවල වෙසෙන වැඩිහිටියන් එයට වඩා අවම මට්ටමකින් උෂ්ණත්වයේ බලපෑම මත සිදුවන දේශගුණික බලපෑමට ලක්වෙන බැවින් මෙම ප්‍රවේශය මගින් අනෙකුත් සියලුම ස්ථාන මෙම ප්‍රදේශයට වඩා උණුසුම් හා තාප තත්වයන්ට අඩු අවදානමක් ඇති බව සනාථ කරයි.<br>අනෙක් ව්‍යාපෘතියේ වියදම් කරන ලද මුදලට සාධාරණයක් වන ලෙසින් තේ සහ පොල් යන වගා ක්ෂේත්‍රයේ පමණක් ආවරණය වන පරිදි පර්යේෂණය අවසන් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී . මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල තේ සහ පොල් වගාවන්ට අදාල නිර්දේශ ලබා දීමට ප්‍රමාණවත් තරම් වනු ඇත. | රජයේ අරමුදල් වැය කරමින් සිදු කරන ලද ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ළඟා කර ගත යුතුය. |
| (ඇ) 2023 වර්ෂයේ දී තාක්ෂණික පැවරුම් ව්‍යාපෘති 04 ක් සඳහා එකතුව රු. 15,469,633 ක් ප්‍රදානය කර තිබුණු අතර ඉන් ව්‍යාපෘති 02 ක් ප්‍රමාද කාල සහිතව අවසන් කර තිබුණි. එම ව්‍යාපෘති 02 හි එක් ප්‍රදානලාභියෙකු සම්බන්ධ කර ගැනීමේ ගැටළුවකට පදනම මුහුණ පා තිබූ අතර තවත් ප්‍රදානලාභියෙකු විශ්‍රාම ගොස් විදේශ ගත වී තිබුණි. එම හේතූන් නිසා ප්‍රදාන ගිවිසුමේ 8.5.1 ප්‍රකාරව ප්‍රදානලාභීන් කටයුතු කල යුතු නමුත් එසේ කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති 03 කට අදාළව ගිවිසුමේ 8.5.1 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන පර්යේෂකයා විසින් වසර 5 ක කාලයක් ව්‍යාපෘතියට අදාළ නවතම ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් 2024 මැයි මස අවසන් වීමට පෙර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. අනෙක් ව්‍යාපෘතියේ ප්‍රදානලාභියා සම්බන්ධ කර ගැනීමේ ගැටළුව සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ග්‍රාම නිළධාරීතුමාගෙන් රහස්‍ය වාර්තාවක් කැඳවන ලද අතර පොලිසියේ පැමිනිල්ලක් ද ගොනු කර ඇත | ව්‍යාපෘති 04 ට අදාළව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු අතර පවතින පාලන ක්‍රමය වැඩි දියුණු කිරීම කල යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 මාර්තු 15 සිදු කළ ගබඩා භාණ්ඩ පිළිබඳ භෞතික පරීක්ෂාවේ දී භාවිතා කල හැකි තත්ත්වයේ පවතින සියලු උපාංග සහිත රු.750,750 ක් වටිනා පරිගණක 07 ක් හා සැකසුම් ඒකක (CPU) 14 ක් ද, මොනිටර් 12 ක් හා යතුරු පුවරු (keyboard) 16 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම All-In-One පරිගණක යන්ත්‍ර 2016 වර්ෂයේ නිෂ්පාදිත දේශීය නිෂ්පාදනයක් වන අතර, මෘදුකාංග යාවත්කාලින කරමින් තව දුරටත් ආයතනික පරිගණක ජාලය තුල භාවිතා කල නොහැකි බැවින් සේවයෙන් ඉවත්කොට ඇත. සංවේදී තොරතුරු ඉවත් කර ක්‍රමණානුකූලව අපහරණය කරනු ලැබේ. | උපකරණ ඵලදායී අයුරින් ප්‍රයෝජනයට ගත යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික විද්‍යා පදනම විසින් 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 6 ක් සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 4 ක් ලැබී තිබුණු ද වර්ෂය තුල දී රුපියල් මිලියන 0.72 ක් පමණක් වියදම් කර තිබීම හේතුවෙන් මුල්‍ය ප්‍රගතිය සියයට 18 ක් විය. සැලසුම ඒ ඒ කාර්යය සඳහා අපේක්ෂිත ඉලක්කවලට ලඟා වීම සංඛ්‍යාත්මකව දක්වා නොතිබුණු අවස්ථා 13 ක් විය. | කාර්යය මණ්ඩල හිඟතාවය, ප්‍රතිපාදන සීමා කිරීම, ප්‍රවාහන අපහසුතාවය හා නියමිත වේලාවට ප්‍රතිපාදන නොමැති වීම, වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීමට අපහසු වීම හේතුවෙන් අරමුණු ලඟා කර ගත නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතුයි. |